# ගාලු උරුමය
# GALLE HERITAGE

ලෝක උරුමයක අභිමානය සුරකින නිල පුවත් සංග්‍රහය

GALLE HERITAGE FOUNDATION



කලාපය: 2026 ජනවාරි - මාර්තු | පළමු කලාපය

- සංචාරක කර්මාන්තය නැවත අර්ථගැන්වූ ලංකා-ඕලන්ද සමුළුව
- කොටුවේ වීදි සුනඛ එන්නත්කරණ මෙහෙයුම
- Galle Heritage Emporium ලංසු කැඳවීම

# 'ගාලු උරුමය පුවත් සංග්‍රහය'

රූ

## කර්තෘ මණ්ඩලය සහ සම්බන්ධීකරණ විස්තර

### සම්බන්ධීකරණ විස්තර


**ලිපිනය:**
අංක 12, රැම්පාර්ට් විදිය,
කොටුව, ගාල්ල.

**දුරකථන:**
0912246784

**විද්‍යුත් තැපැල:**
herifo@sltnet.lk




### කර්තෘ මණ්ඩලය සහ මෙහෙයුම් කණ්ඩායම

#### උපදේශකත්වය

- සභාපති-මහාචාර්ය දේව මයිකල් ද සිල්වා මයා
- අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී-අසංග උදුල ධර්මදාස මයා

#### ප්‍රධාන සංස්කාරක

- සංවර්ධන නිලධාරී - ඩබ්. ඒ. අයේෂා මිය

#### අංශ ප්‍රධාන (සංස්කරණ)

- ව්‍යාපෘති සහකාර - පී.ජී.එන්. චන්දිමාලි මිය
- කළමනාකරණ සහකාර -බී.එස්. ඉලේපෙරුම මිය
- ගිණුම් නිලධාරී (ර.ඉ) - නුවන් මධුෂංක මයා

#### විශේෂාංග ලේඛකයන්

- ව්‍යාපෘති සහකාර (ගිණුම්) -රිද්මි නානායක්කාර මිය
- ව්‍යාපෘති සහකාර - රොෂාන් රණසිංහ මයා
- සංවර්ධන නිලධාරී -අනුෂි චාන්දිමා මෙය
- සංවර්ධන නිලධාරී- චම්පා කුමුදුනී මෙනවිය
- කළමනාකරණ සහකාර -ඩිලානි හර්ෂිකා මෙය
- ආරක්ෂක නියාමක -ශිරංග ජයසේකර මයා

#### රූ රටා නිමැවුම්

- සංවර්ධන නිලධාරී - සජිත් ගිහාර මහතා

#### ඡායාරූපකරණය, වෙබ් සහ සමාජ මාධ්‍ය

- කළමනාකරණ සහකාර - ඉෂානි ප්‍රියදර්ශනී මිය
- නෙව්මාල් ශිරන්ත ද සිල්වා මයා
- ඒ.ජී. සමන් කුමාර මයා

*විශේෂ පණිවිඩය*

- **සභාපති පණිවිඩය** ........................................................**02** *(මහාචාර්ය දේව මයිකල් ද සිල්වා)*

---

*ජාත්‍යන්තර සහයෝගීතාවය (Global Partnerships)*

- **ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය නැවත අර්ථගැන්වීම** ...... **03** *(Dutch-Lanka සමුළුව සහ ගාලු ක්ෂේත්‍ර අධ්‍යයනය)*
- **නෙදර්ලන්ත විද්‍යාර්ථයින්ගේ (NAAL) දායකත්වය** ...... **04** *(ත්‍රිමාණ ජ්‍යාමිතිකරණ වැඩසටහන සහ සංරක්ෂණය)*

---

*යටිතල පහසුකම් සහ සංරක්ෂණය (Infrastructure)*

- **පැරණි පල්දෝරු පද්ධතිය පිළිසකර කිරීම** .....................**05** *(පෞරාණික වටිනාකම සුරකිමින් කෙරෙන නඩත්තු කටයුතු)*
- **සංචාරක ආරක්ෂාව තහවුරු කිරීම** .................................**06** *(ප්‍රදීපාගාරයේ සිට කොඩිගල දක්වා මාර්ගය පිළිසකර කිරීම)*

---

*ප්‍රජා සහ සත්ව සුබසාධනය (Community & Welfare)*

- **වීදි සුනඛ සුබසාධන මෙහෙයුම** .....................................**06** *(එන්නත්කරණය සහ හඳුනාගැනීමේ කරපටි පැළඳවීම)*
- **"Clean Walled City" පවිත්‍රතා සත්කාරය** ..................**07** *(නිදහස් දින සැමරුමට සමගාමීව සිදුකළ ශ්‍රමදානය)*

---

*සංචාරක ආකර්ෂණ (Tourist Highlights)*

- **Moon Bastion Lower Terrace** ..................................**08** *(සොබාදහමේ සුන්දරත්වය අත්විඳින පාරාදීසය)*

---

*2025 මතක පිටු අතර.....................*

- බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය **ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමාගේ** ගාලු කොටුව සංචාරය.................................... 09
- **නවසීලන්ත මහ කොමසාරිස්වරයාගේ** දකුණු පළාතේ නිල සංචාරය ............................................**10**
- **චීන සංස්කෘතික හා සංචාරක අමාත්‍යාංශයේ නියෝජිත පිරිසගේ** ගාලු කොටුව සංචාරය........................ .**11-12**

---

*ඉදිරි සැලසුම්...........*

- ජංගම වෙළෙඳුන් නියාමනය කිරීම......................................13
- "ගාලු වංශය" කෘතිය සම්පාදනය කිරීම................................13
- සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය................................13
- වීදිනාම පුවරු ස්ථාපිත කිරීම..............................................13
- නිශ්කාර්ය භූමි/ගොඩනැගිලි ඵලදායී ව්‍යාපෘති සඳහා යෙදවීම..13



# සභාපති පණිවිඩය

**"අපගේ අරමුණ වන්නේ ලෝක උරුම ගාල්ල කොටුවේ ඓතිහාසික අගය සුරකිමින් එය සංචාරක කර්මාන්තයේ කේන්ද්‍රස්ථානයක් ලෙස දියුණු කිරීමයි."**

ලෝක උරුම ගාලු පුරවරයේ අනන්‍යතාවය සහ අභිමානය සුරකිමින්, "ගාලු උරුමය" නිල පුවත් සංග්‍රහයේ මංගල කලාපය සඳහා මෙලෙස පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

2026 වර්ෂය ගාලු උරුමය පදනම සම්බන්ධයෙන් තීරණාත්මක සන්ධිස්ථානයකි. ඒ අනුව, මෙම වසරේ සිට අප පදනම ස්වයං මූල්‍ය ආයතනයක් (Self-financing Institution) ලෙස ස්වාධීනව ක්‍රියාත්මක වීමට නියමිතව ඇත. මෙය හුදෙක් පරිපාලනමය වෙනසක් පමණක් නොව, අපගේ අනාගත දැක්ම වඩාත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යාමට ලැබුණු ස්වර්ණමය අවස්ථාවකි.

අපගේ මූලික අරමුණ වන්නේ අතීත උරුමය සහ එහි ඓතිහාසික පෞරුෂය නොකැළැල්ව ආරක්ෂා කරගනිමින්, නවීන වාණිජ්‍ය ලෝකය සහ ඉතිහාසය එකම වේදිකාවක ප්‍රතිනිර්මාණය කිරීමයි. උරුමය යනු කෞතුකාගාරයක තැන්පත් කර තිබිය යුත්තක් පමණක් නොවන අතර, එය වර්තමානය සමඟ ගැලපෙන අයුරින් අර්ථගැන්වීම හරහා ප්‍රාදේශීය ජන ජීවිතය ආර්ථිකමය හා සමාජීය වශයෙන් උසස් කිරීම අපගේ බලාපොරොත්තුවයි.

එමෙන්ම, ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය තුළ ගාලු කොටුව සතු සුවිශේෂී ආකර්ෂණය තවදුරටත් වර්ධනය කරමින්, එයින් ලැබෙන ප්‍රතිලාභ සෘජුවම ජාතික ආර්ථිකයේ වර්ධනයට සක්‍රියව දායක කිරීමට අපි කැපවී සිටිමු.

ගාල්ලේ ඓතිහාසික උරුමය හෙට දවස වෙනුවෙන් සුරක්ෂිත කරන අතරම, එය රටේ ආර්ථික සංවර්ධනයේ සජීවී කොටසක් බවට පත්කිරීමේ මෙම අභියෝගාත්මක ගමනට ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරමි.

**මහාචාර්ය දේව මයිකල් ද සිල්වා**
සභාපති,
ගාලු උරුමය පදනම.

# ජාත්‍යන්තර සහයෝගීතාවය (Global Partnerships)

ගාලු උරුමය ජාත්‍යන්තර මට්ටමින් ප්‍රවර්ධනය කිරීම සහ සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා විදේශීය තාක්ෂණික හා අධ්‍යාපනික සහය ලබා ගැනීම අපගේ මූලික උපායමාර්ගයකි. 2026 වසරේ මුල් කාර්තුව තුළ ඒ සම්බන්ධයෙන් සුවිශේෂී ප්‍රගතියක් අත්කර ගැනීමට අප පදනම සමත් විය.

## ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය නැවත අර්ථගැන්වීමේ ක්ෂේත්‍ර අධ්‍යයනය



*ඡායාරූපය : 2026 මාර්තු 05 දින ගාල්ලේදී පැවැත්වූ ලංකා-ඕලන්ද සමුළුවේ විශේෂ අවස්ථාවක්.*

2026 මාර්තු මස 05 වන දින ගාල්ල ලෝක උරුම පරිශ්‍රයේදී **"Dutch-Lanka Conference on Reimagining Sri Lanka Tourism"** යන තේමාව යටතේ විශේෂ ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහනක් සහ සම්මන්ත්‍රණයක් පැවැත්විණි.

මෙම සුවිශේෂී වැඩසටහන **රජරට විශ්වවිද්‍යාලය** සහ නෙදර්ලන්තයේ **Breda University** එක්ව සංවිධානය කරන ලද්දකි. මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ:



- ගාලු කොටුවේ ඓතිහාසික පසුබිම සංචාරක ආකර්ෂණය සඳහා භාවිත කිරීමේ නව ප්‍රවණතා.
- තිරසාර සංචාරක ව්‍යාපාරය (Sustainable Tourism) හරහා උරුමයන් ආරක්ෂා කරමින් ආර්ථික ප්‍රතිලාභ ලැබීම.
- දේශීය සහ විදේශීය විශ්වවිද්‍යාල සිසුන් අතර සංස්කෘතික හා දැනුම හුවමාරු කර ගැනීම.



**නෙදර්ලන්ත විද්‍යාර්ථයින්ගේ (NAAL) දායකත්වය සහ ත්‍රිමාණ ජ්‍යාමිතිකරණ වැඩසටහන**

ගාලු කොටු පවුරේ සහ එහි ස්මාරකයන්හි පැවැත්ම තහවුරු කිරීම සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම පිළිබඳව 2026 පෙබරවාරි 21 දින විශේෂ සාකච්ඡාවක් පැවැත්විණි.

මෙහිදී නෙදර්ලන්තයේ විද්‍යාර්ථයින්ගේ සංගමය (**NAAL**) සමඟ අත්සන් කරන ලද එකඟතාවයන් අනුව පහත පියවර ගැනීමට තීරණය විය:



1. **ත්‍රිමාණ ජ්‍යාමිතිකරණ (3D Geometric Modeling):** කොටු පවුරේ ව්‍යුහය ඉතා නිරවද්‍ය ලෙස ත්‍රිමාණ තාක්ෂණය ඔස්සේ සිතියම්ගත කිරීම සහ සංරක්ෂණ සැලසුම් සකස් කිරීම.
2. **ක්ෂේත්‍ර නිරීක්ෂණ:** සාකච්ඡාවෙන් අනතුරුව නෙදර්ලන්ත නියෝජිත පිරිස කොටු පවුරේ සහ ඉපැරණි ගොඩනැගිලිවල වත්මන් තත්ත්වය පිළිබඳව විශේෂ නිරීක්ෂණයක යෙදුණු අතර, ඉදිරි තාක්ෂණික සහයෝගීතාවය සඳහා අවශ්‍ය මූලික දත්ත රැස් කරන ලදී.

මෙම ජාත්‍යන්තර සබඳතා හරහා ගාලු කොටුව හුදෙක් ප්‍රාදේශීය ස්මාරකයක් නොව, ලෝක මට්ටමේ පර්යේෂණ සහ අධ්‍යයන මධ්‍යස්ථානයක් ලෙස ගොඩනැගීමට ගාලු උරුමය පදනම අඛණ්ඩව කටයුතු කිරීමට අපේක්ෂාකෙරේ.

# පැරණි පල්දෝරු පද්ධතිය පිළිසකර කිරීම: උරුමය සහ තාක්ෂණයේ සුසංයෝගය



ගාල්ල ලෝක උරුම කොටු පවුරේ ආරක්ෂාව සහ එහි අභ්‍යන්තර නගර සැකසුම විද්‍යාත්මකව පවත්වාගෙන යාම සඳහා ඕලන්ද පාලන සමයේ නිර්මාණය කරන ලද "පල්දෝරු පද්ධතිය" (Sluice Gates and Underground Drainage System) සුවිශේෂී මෙහෙවරක් ඉටු කරයි. දශක ගණනාවක් පුරා නිසි නඩත්තුවක් නොමැතිව පැවතීම හේතුවෙන් අවහිර වී තිබූ මෙම පද්ධතිය යළි ක්‍රියාත්මක කිරීමේ දැවැන්ත ව්‍යාපෘතියක් 2026 වසරේදී ආරම්භ විය.

**ඒ අනුව,** පල්දෝරු පද්ධතියේ පවතින අවහිරතා හඳුනා ගැනීම සහ ඒවා පිළිසකර කිරීම සඳහා රාජ්‍ය ආයතන රැසක සහභාගීත්වයෙන් යුත් විශේෂ සාකච්ඡාවක් 2026 පෙබරවාරි 16 වන දින ගාලු උරුමය පදනමේදී පැවැත්විණි. මීට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ගාල්ල මහ නගර සභාව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරුන් සහභාගී විය.මෙහිදී ,

- පැරණි පල්දෝරු පද්ධතිය අවහිර වීම සහ නඩත්තු නොවීම
- ගාලු කොටුවේ ගිලා බැස ඇති ස්ථාන
- කොටු බැම්මේ අවදානම් සහිත අනාරක්ෂිත ප්‍රදේශ
- නිෂ්කාර්ය භූමි හා ගොඩනැගිලි, ගරාවැටි ඇති ගොඩනැගිලි ආදිය හඳුනාගැනීම හා ඵලදායි භාවිතාවන සඳහා යෙදවීම.
- ගාලු කොටුව පරිශ්‍රයේ රථවාහන සැලැස්ම තවම ක්‍රියාත්මක නොවීම.

ආදී, ගැටලු සඳහා නිශ්චිත කාලරාමුවක් තුළ ක්‍රියාත්මක කළ හැකි විසඳුම් හඳුනාගෙන, අදාළ ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය.

**සටහන:** පල්දෝරු පද්ධතිය යනු හුදෙක් කාණු පද්ධතියක් නොව, එය උදම් රළ පාලනය කිරීම සඳහා ඕලන්ද ඉංජිනේරුවන් භාවිතා කළ ඉතා දියුණු ජල කළමනාකරණ ක්‍රමයකි. මෙය ආරක්ෂා කර ගැනීම අප සැමගේ වගකීමකි.





## සංචාරක ආරක්ෂාව තහවුරු කිරීම

යටිතල පහසුකම් සංවර්ධනයේ තවත් පියවරක් ලෙස, කොටු පවුරේ සංචාරකයන් බහුලව ගැවසෙන ප්‍රදේශවල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගැනුණි. විශේෂයෙන්ම **ප්‍රදීපාගාරයේ සිට කොඩිගල දක්වා** වූ ගමන් මාර්ගයේ පැවති අනාරක්ෂිත සහ ඛාදනය වූ ස්ථාන 2026 ජනවාරි 30 වන දින වැලිකොට්ට යොදා තාවකාලිකව පිළිසකර කරන ලදී. මෙය ස්ථිර ලෙස සංරක්ෂණය කරන තෙක් සංචාරකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ගත් කඩිනම් පියවරකි.

## වීදි සුනඛ සුබසාධන සහ එන්නත්කරණ මෙහෙයුම



කොටුව පරිශ්‍රයේ ගැවසෙන වීදි සුනඛයන් සංචාරකයන්ට හෝ ප්‍රදේශවාසීන්ට පීඩාවක් නොවන අයුරින් කළමනාකරණය කිරීමේ අරමුණින් **2026 පෙබරවාරි 15** වන දින විශේෂ මෙහෙයුමක් දියත් කරන ලදී. රජයේ පශු වෛද්‍ය නිලධාරීන්ගේ සහ ස්වේච්ඡා සංවිධානවල සහයෝගය ඇතිව ක්‍රියාත්මක වූ මෙම වැඩසටහනේදී:



- **එන්නත්කරණය:** ජලභීතිකා රෝගයෙන් තොර කලාපයක් නිර්මාණය කිරීම සඳහා කොටුව තුළ සිටින සියලුම වීදි සුනඛයන් එන්නත් කරන ලදී.
- **හඳුනාගැනීමේ කරපටි (Collars):** එන්නත් කරන ලද සහ සෞඛ්‍ය පරීක්ෂාවට ලක් කළ සුනඛයන් පහසුවෙන් හඳුනාගැනීම සඳහා ඔවුන්ට විශේෂ කරපටි පැළඳවීමට පියවර ගැනුණි.
- **ජනතාව දැනුවත් කිරීම:** සංචාරකයන්ට අනවශ්‍ය බියක් ඇති නොවීමටත්, සතුන්ට මානුෂීය ලෙස සැලකීමටත් මෙහිදී උපදෙස් ලබා දෙන ලදී.

# සුරක්ෂිත සහ පිරිසිදු ගාලු පුරවරයක්....



ගාලු කොටුව යනු හුදෙක් ඓතිහාසික ස්මාරකයක් පමණක් නොව, එය දහස් සංඛ්‍යාත ජනතාවක් සහ සතුන් වෙසෙන සජීවී පරිසරයකි. සමස්ත නගරයේ පවිත්‍රතාවය රැකගැනීම වෙනුවෙන් 2026 වසරේ මුල් කාර්තුව තුළ විශේෂ ව්‍යාපෘතියක් ලෙසින් **"Clean Walled City" පවිත්‍රතා සත්කාරය** සිදුකරනු ලැබිණි.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ 78 වන නිදහස් දින සැමරුමට සමගාමීව, ගාලු කොටු පවුර සහ ඒ අවට පරිශ්‍රය පවිත්‍ර කිරීමේ මහා ශ්‍රමදාන වැඩසටහනක් **2026 පෙබරවාරි 04** වන දින පැවැත්විණි.

**"පිරිසිදු පවුරක් - ලස්සන ගාල්ලක්"** යන තේමාව යටතේ පැවති මෙම වැඩසටහනේ සුවිශේෂීතා:

- **ප්‍රජා සහභාගීත්වය:** ප්‍රදේශවාසීන්, වෙළඳ ප්‍රජාව සහ පාසල් දරුවන් විශාල පිරිසක් මීට ස්වේච්ඡාවෙන් එක් විය.
- **ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඉවත් කිරීම:** පවුර මත සහ බෑවුම්වල රැඳී තිබූ ප්ලාස්ටික් බෝතල් සහ දිරා නොයන අපද්‍රව්‍ය සියල්ල ඉවත් කර නිසි පරිදි ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන ලදී.
- **සංචාරක ආකර්ෂණය:** මෙම පවිත්‍රතා මෙහෙයුම නිසා සංචාරකයන්ට වඩාත් ප්‍රසන්න සහ සෞඛ්‍යාරක්ෂිත පරිසරයක සංචාරය කිරීමට අවස්ථාව උදා විය.





**අපේ අරමුණ:** පරිසරයට ආදරය කරන ශිෂ්ටසම්පන්න ප්‍රජාවක් සමඟින් ගාලු උරුමය ලෝකයට ගෙනයාමයි

# ඉතිහාසය සහ සොබාදහම හමුවන නිම්නය...




ලෝක උරුම ගාලු කොටුවේ ඇති වඩාත්ම ආකර්ෂණීය ස්ථාන ද්විත්වය වන සඳු අට්ටාලය (Moon Bastion) සහ සඳු ගැලරි (Moon Gallery) සංචාරකයින් සඳහා නවමු අත්දැකීම් රැසක් තිළිණ කරයි.



## MOON BASTION LOWER TERRACE:

### හිරු බැසයන දර්ශනීය පාරාදීසය

ගාලු කොටු පවුරේ පිහිටි 'මූන් බැස්ටියන්' හෙවත් 'සඳ බලකොටුව' යනු අතීතයේ ආරක්ෂක කටයුතු සඳහා ඉහළ වැදගත්කමක් ඉසිලූ ස්ථානයකි. මෙහි පහළ මළුව (Lower Terrace) වර්තමානයේ දෙස් විදෙස් සංචාරකයන්ගේ ප්‍රියතම ගිමන් හලක් බවට පත්ව ඇත.



- **පෞරාණික ශක්තිය:** ශක්තිමත් කළුගල් පවුර සහ එහි ඉපැරණි බව අතීත යුධ තාක්ෂණයේ අභිමානය කියාපායි.
- **සොබාදහමේ සුන්දරත්වය:** ඉන්දියන් සාගරයේ නිල්වන් දියකඳට ඉහළින් හිරු බැසයන දර්ශනය (Sunset) නැරඹීමට කොටුව තුළ ඇති හොඳම ස්ථානය මෙයයි.
- **සංචාරක අත්දැකීම:** සවස් කාලයේ නිදහසේ ඇවිද යාමටත්, ඡායාරූපකරණයේ යෙදීමටත් මෙහි ඇති මනරම් වටපිටාව කදිමට ගැලපේ.

## Moon Gallery අත්දැකීම: කලාව සහ උරුමය එකම තැනකදී....................

සංස්කෘතික සංචාරක ව්‍යාපාරය (Cultural Tourism) ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ස්ථාපිත කර ඇති **Moon Gallery**, ගාලු කොටුවට පැමිණෙන ඕනෑම අයෙකු නැරඹිය යුතුම ස්ථානයකි.

**සංචාරක උපදෙස්: පවුර මත ඇවිදීමේදී එහි පෞරාණිකත්වයට හානි නොවන ලෙස හැසිරීමටත්, පරිසරය පිරිසිදුව තබා ගැනීමටත් කාරුණික වන්න.**

# ඓතිහාසික ගාලු උරුමය නව මාවතකට

## ලෝක උරුම ගාලු කොටුවේ ප්‍රවර්ධනය හා සංරක්ෂණය සඳහා නව වැඩපිළිවෙළක



*අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමා සහ නලින් හේවගේ මැතිතුමා ඇතුළු පිරිස ගාලු කොටු පරිශ්‍රයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින්.*

ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ අභිමානය මෙන්ම යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස දෙස් විදෙස් ගෞරවයට පාත්‍ර වූ ඓතිහාසික ගාලු කොටුව, නූතන ලෝකයට ගැලපෙන අයුරින් ප්‍රවර්ධනය කිරීමේ හා සංරක්ෂණය කිරීමේ නව පරිච්ඡේදයක් පසුගියදා සනිටුහන් විය. ඒ, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගාලු උරුමය පදනමේදී පැවැති විශේෂ සාකච්ඡාවත් සමඟිනි.

ගාලු කොටුවේ ඓතිහාසික අනන්‍යතාවය සුරකිමින් එය සංචාරක සහ සංස්කෘතික කේන්ද්‍රස්ථානයක් ලෙස දියුණු කිරීමේ අරමුණින් ගාලු උරුමය පදනම මගින් සකස් කරන ලද "සංයුක්ත සැලැස්ම" (Composite Plan) මෙහිදී විශේෂ අවධානයට ලක් විය. පදනමේ සභාපති මහාචාර්ය දේව මයිකල් ද සිල්වා මහතා විසින් මෙතෙක් සිදුකර ඇති සංවර්ධන කටයුතු මෙන්ම, හෙට දවසේ ගාලු කොටුව වෙනුවෙන් වූ දැක්ම අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදි.



*"නිෂ්කාර්ය රාජ්‍ය සම්පත් ඵලදායී ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට අවශ්‍ය සියලු පහසුකම් කඩිනමින් ලබා දෙනවා."*

මෙම සැලැස්ම හුදෙක් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණයකට පමණක් සීමා නොවී, කොටු පවුරේ ආරක්ෂාව, පාරිසරික සමතුලිතතාවය සහ සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීම යන අංශ රැසක් ආවරණය වන පරිදි සකස් කර තිබීම විශේෂත්වයකි.

සාකච්ඡාවෙන් අනතුරුව, යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශ නිරීක්ෂණය කිරීම සඳහා අමාත්‍යවරයා ඇතුළු පිරිස කොටු පරිශ්‍රයේ සංචාරයක නිරත වූහ. මෙම අවස්ථාව සඳහා වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය නලින් හේවගේ මැතිතුමා, නාගරික මන්ත්‍රී මනෝජ් මහතා සහ ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂ අසංග ධර්මදාස මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

## නවසීලන්ත මහ කොමසාරිස්වරයා දකුණු පළාතේ නිල සංචාරයක

**ගාලු කොටුවේ සංවර්ධනය සහ උරුමයන් සුරැකීම පිළිබඳ සාකච්ඡා පවත්වයි**

ශ්‍රී ලංකාව සහ නවසීලන්තය අතර පවතින ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින්, නවසීලන්ත මහ කොමසාරිස් අතිගරු ඩේවිඩ් පයින් (David Pine) මහතා පසුගියදා දකුණු පළාතේ නිල සංචාරයක නිරත විය. මෙම සංචාරයේ විශේෂාංගයක් ලෙස ඒ මහතා **ගාලු උරුමය පදනමේ (Galle Heritage Foundation)** නිලධාරීන් හමු වී විශේෂ සාකච්ඡාවක නිරත විය.



මෙම හමුවේ ප්‍රධාන අරමුණ වූයේ දෙරට අතර පවතින මිත්‍රත්වය තහවුරු කිරීම සහ දකුණු පළාතේ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සමීප සම්බන්ධතා ගොඩනැගීමයි. විශේෂයෙන්ම ඓතිහාසික ගාලු කොටුව කේන්ද්‍ර කරගත් සංවර්ධන කටයුතු පිළිබඳව මෙහිදී අවධානය යොමු විය.

ඒ අනුව, ගාලු උරුමය පදනම සහ මහ කොමසාරිස්වරයා අතර පැවති මෙම හමුවේදී දෙපාර්ශවයටම වැදගත් වන ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව අදහස් හුවමාරු කර ගන්නා ලදී:



**සංස්කෘතික උරුමයන් සංරක්ෂණය:** යුනෙස්කෝ ලෝක උරුමයක් වන ගාලු කොටුවේ ඓතිහාසික වටිනාකම රැකගනිමින් සිදුකෙරෙන සංරක්ෂණ ව්‍යාපෘති.

**සංචාරක ප්‍රවර්ධනය:** නවසීලන්ත සහ ශ්‍රී ලාංකික සංචාරක ක්ෂේත්‍රයන් අතර සහයෝගීතාව වර්ධනය කිරීම.

**ඒකාබද්ධ ව්‍යාපෘති:** දකුණු පළාතේ අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක කළ හැකි අනාගත සංවර්ධන වැඩසටහන්. පිළිබඳ අදහස් හුවමාරුකර ගන්නා ලදී.

මෙම අවස්තාව, ශ්‍රී ලංකාව සහ නවසීලන්තය අතර පවතින සහයෝගීතාවයේ නව සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. ගාලු උරුමය පදනම, අතිගරු ඩේවිඩ් පයින් මහතා සහ නවසීලන්ත මහ කොමසාරිස් කාර්යාලය දැක්වූ මෙම උනන්දුව සහ සහයෝගය පිළිබඳව සිය කෘතඥතාව පළ කර සිටියි.

## ගාල්ල සහ චීනය අතර පැවති පෞරාණික වෙළඳ හා සංස්කෘතික සබඳතා නව මානයකින් ඉදිරියට ගෙන යාමේ තීරණාත්මක පියවරක්.

ගාල්ල දිස්ත්‍රික්කය හා චීනය අතර ඇති ඓතිහාසික සම්බන්ධකම් යළි පෙර පරිදිම ප්‍රතිනිර්මාණය කිරිම සම්බන්ධයෙන් ගාලු උරුමය පදනම හා චීන සංස්කෘතික හා සංචාරක අමාත්‍යාංශයේ නියෝජිත පිරිසක් අතර විශේෂ සාකච්ඡාවක් 2025.06.15 දින ගාලු උරුමය පදනමේදී පවත්වන ලදී.

**සභාපතිවරයාගේ අදහස්**

"ශ්‍රී ලංකාව හා චීනය අතර තිබූ ඓතිහාසික ද්විපාර්ශ්වික හා වාණිජ සම්බන්ධතා වලදී ගාල්ල නගරය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළා. මෙම අතීත සබඳතා වර්තමානයට ගැලපෙන ලෙස යළි පණ ගැන්වීම අපේ අරමුණයි."

***— මහාචාර්ය දේව මයිකල් සිල්වා***

**චීන නියෝජිත පිරිසේ සුභවාදී ප්‍රතිචාරය**

චීන සංස්කෘතික හා සංචාරක අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සහයෝගිතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ෂි ෂේයි මහතා පවසා සිටියේ චීනයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන සෑම සංචාරකයෙකුගේම ප්‍රධාන ගමනාන්තය ගාල්ල වීම අනිවාර්ය කරුණක් වී ඇති බවයි. ගාලු කොටුවේ ඇති අසමසම සුන්දරත්වය සහ වටිනාකම අගය කළ ඒ මහතා, ඉදිරියේදී නව සහයෝගිතා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව ද අවධාරණය කළේය.

> ***"ගාල්ල හරිම ලස්සනයි. ගාලු කොටුව ඉතා ඉහළ ඓතිහාසික වටිනාකම් සහිත ස්ථානයක්. ගාලු උරුමය පදනම විසින් අපට ලබා දුන් ඉතා ඉහළ ගෞරවනීය පිළිගැනීම පිළිබඳව අපගේ විශේෂ ස්තුතිය පුද කරනවා."***
>
> — අධ්‍යක්ෂ ජනරාල් ෂි සේයි මහතා









මෙම අවස්ථාව සඳහා, ජාත්‍යන්තර සහයෝගිතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්- ෂි සේයි මහතා, ආසියානු අංශයේ අධ්‍යක්ෂ - යූ මින් මහත්මිය, ආසියානු අංශයේ උපදේශක - මාලී මහත්මිය, චීන තානාපති කාර්යාලයේ සංස්කෘතික උපදේශක -  ජී. ලිලි මහත්මිය, චීන තානාපති කාර්යාලයේ දෙවන ලේකම් - හූ හුයි මහත්මිය, චීන තානාපති කාර්යාලයේ තෙවන ලේකම් - ජියැං වැං මහතාත් ගාලු උරුමය පදනමේ සභාපති - මහාචාර්ය දේව මයිකල් සිල්වා මහතා, අධ්‍යක්ෂ - අසංග උදුල ධර්මදාස මහතා සහ කළමනාකරණ මණ්ඩල සාමාජික (වාස්තු විද්‍යාඥ)- වරුණ ද සිල්වා මහතා යන නිලධාරීන් රැසක් සම්බන්ධ විය.

# උරුමය සුරකිමින් ඇරඹෙන නව ව්‍යාපෘති

**ගාලු උරුමය පදනම 2026 වසරේ සිට ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස නව ගමනක් ආරම්භ කර ඇති අතර, එහි මීළඟ පියවර ලෙස ගාලු කොටුවේ ඓතිහාසික, සංස්කෘතික සහ ආර්ථික වටිනාකම ඉහළ නැංවීම සඳහා දැවැන්ත ව්‍යාපෘති රැසක මූලික සැලසුම් මේ වන විට සකස් කර අවසන්ව ඇත.**

**අනාගත ව්‍යාපෘති පෙළගැස්ම:**


- **ජංගම වෙළෙඳුන් නියාමනය කිරීම :** සංචාරකයන්ට බාධාවක් නොවන පරිදි ගුණාත්මක සේවාවක් වෙනුවෙන් ජංගම වෙළෙඳුන් විධිමත් ලෙස නියාමනය කිරීම.
- **"ගාලු වංශය" කෘතිය සම්පාදනය කිරීම:** ගාලු කොටුවේ ඉතිහාසය, එහි පරිණාමය සහ උරුමය පිළිබඳව පර්යේෂණාත්මක තොරතුරු ඇතුළත් "ගාලු වංශය" ග්‍රන්ථය සකස් කිරීම
- **සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය:** කොටුවට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ගේ පහසුව සඳහා තොරතුරු මධ්‍යස්ථාන, සනීපාරක්ෂක පහසුකම් සහ ගිමන් හල් සහ පානීය ජල ගැටළු සඳහා විසඳුම්
- **වීදිනාම පුවරු ස්ථාපිත කිරීම:** ඓතිහාසික වීදි නාම සහ ඒවායේ වැදගත්කම විදහා දැක්වෙන පරිදි ආකර්ෂණීය සහ පැහැදිලි වීදිනාම පුවරු කොටුව පුරා ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.
- **නිශ්කාර්ය භූමි සහ ගොඩනැගිලි ඵලදායී ව්‍යාපෘති සඳහා යෙදවීම:** කොටුව තුළ දැනට භාවිතයට නොගෙන පවතින රජයට අයත් භූමි සහ ගොඩනැගිලි හඳුනාගෙන, ඒවායේ පෞරාණික වටිනාකම සුරකිමින් සංස්කෘතික මධ්‍යස්ථාන, කලාගාර හෝ වෙනත් ඵලදායී ව්‍යාපෘති සඳහා යොදා ගැනීම.

## අපගේ බලාපොරොත්තුව...........

**මෙම ව්‍යාපෘතීන් හරහා ගාලු කොටුව හුදෙක් සංචාරක ගමනාන්තයක් පමණක් නොව, ඉතිහාසය සහ වර්තමානය මනාව කළමනාකරණය කරන ලද ආදර්ශමත් ලෝක උරුම පුරවරයක් බවට පත්කිරීමට අපි කැපවී සිටිමු**

**ලිපිනය:** ගාලු උරුමය පදනම, අංක 12, රැම්පාට් වීදිය, ගාලු කොටුව.
**දුරකථන:** 091-2246784
**විද්‍යුත් ලිපිය:** herifo@sltnet.lk
**වෙබ්:** www.galleheritage.gov.lk

GALLE HERITAGE FOUNDATION


ගාලු උරුමය
Galle Heritage
ඉදිරි ව්‍යාපෘති
ජංගම වෙළඳුන් නියාමනය කිරීමේ නව පද්ධතිය
පෞරාණික නිශ්කාර්ය ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය
උරුම සන්නිවේදන වැඩසටහන් දියත් කිරීම
ලෝක උරුමයක අභිමානය සුරකින නිල පුවත් සංග්‍රහය
කලාපය: 2026 ජනවාරි - මාර්තු | පළමු කලාපය
GALLE HERITAGE FOUNDATION
ලිපිනය: ගාලු උරුමය පදනම, අංක 12, රැම්පාට් වීදිය, ගාලු කොටුව.
දුරකථන: 091-2246784
විද්‍යුත් ලිපිය: herifo@sltnet.lk
www.galleheritage.gov.lk